# මේ මගේ නවාතැනයි

BACK TO MY PLACE..

අතුල කල්දෙමුල්ල





1 කොටස් ලෙසින් ලියන සත්‍යයට ලංවූ මනඃකල්පිතයක්

විශ්ව විද්‍යාලයේ ලැබෙන නිවාඩු කාලයත් සමග විනෝද චාරිකා වන් හි යෙදෙන්නට තරුණ තරුණියන් දෙන්නේ මුල් තැනක් ඩයන් ,ඉෂා ,රිකී, කේසර, රොමේෂ් නිව් සවුත් වේල්ස්යේ විශ්ව විද්‍යාලයේ ඉගෙන ගන්නා සිසුන්. හිතවත්කම හා සහෝදරත්වය පෙරටුකොටගත් ඔවුනට එකිනෙකාගේ මිත්‍රත්වය දැනෙන්නේ තවත් ආත්මීය බැඳීමක් ලෙසයි.
විශ්ව විද්‍යාලයේ එක් එක් අංශයන් හි ඉගෙනිම් ලැබුවත් ශ්‍රීලාංකික යහළු යෙහෙලියන් හැටියට ඔවුන්ගේ ගමන් බිමන් චාරිකාවලදී මේ කිහිපදෙනාගේ එකමුතුවයි මූලිකත්වය ගන්නේ. ඒ නිසාම තමා දවස් කිහිපයක චාරිකාවකට මොවුන් එකතු වන්නේ.

සිඩ්නි සිට නිව්කාසල් ප්‍රදේශයට දිවෙන මාර්ගයේ "බකටි"නම් වු ප්‍රදේශයයි.
වසන්තය ගෙවී ගොස් එළැඹුන උණුසුම් වු ගිම්හානය තවත් විනෝදමය කාලපරිච්ඡේදයකටයි මුල් තැන ගන්නේ. දැඩි අව්රස්නයක් අතරින් දෙපස ගස් කොළ වලින් ගහන වු ඈතට විහිදී යන මාර්ගයේ දිවෙන නවීන පන්නයේ ජිප් රථයක්.
රථයේ සී.ඩී තැටි ධාවන යන්ත්‍රයේ හඬ නැගෙන්නා වු සිහින් සංගීත රාවය අතරතුර රියදුරු අසුනේ ඉන්නා ඩයන්ගේ දෑස ඉදිරිපස ඇති කන්නාඩි වෙත යොමු-වන්නේ තම සගයන්ගේ නිහඬතාවය මන්දැයි සිත යොමු කරමින්.

හෝරාවකට අධික කාලයක් ගෙවීයන මග හිතවතුන්ගේ නිදිබරිත වු දෙඇස්වගේම ඉදිරිපස අසුනේ තමා අසලින් ම අසුන්ගෙන ඉන්නා තම පෙම්වතිය වූ "ඉෂා" සංගීතරාවයට අනුව ඒ මේ අත පැද්දෙමින් නැලවෙන විලාසය ඩයන්ට පෙනේ. ඇය ද වරින්වර ඩයන් දෙස බලන්නේ කොයි මොහොතේද ඔවුන් සොයනා නවාතැන්පලට ලඟාවන්නේ යන බලාපොරොත්තුවෙනුයි.
ඩයන්....දැන් සිඩ්නි ඉදලා පැය එකා මාරක් වගේ අපි ආවානේ. හැරෙන තැන ඔයාලට මතකද?
" ඒයි මෙන්න වැඩක් මේන්....කට්ටිය හොදටම හීන බලනව හලෝ.... නැගිටිනවලා නැගිටිනවලා... පිටුපස අසුනේ දැඩි නින්දට වැටුනු යහළුවන් අවදිකරවන්නේ ඉෂාගේ කෑගැසීමෙනි.
නිදිබරිත වූ දෙඇස් පිසිමින් එකිනෙකා අවදි වේ. "ඕන් ටකේ හොල්ලන්න ගත්තා. හරි ඇනයක්නෙ ඊයෙ රෑත් හරියට නින්දක් නෑ. බඩු පැක්කිරිල්ලයි ඉෂාගේ බයිලා ඇහිල්ලයි.

ඒක නෙමේ ඩයන් කොහෙද බන් මේ දැන්. කේසරගේ අලස වු කතා බහට ඩයන් ගේ පිලිතුරින් අනෙක් යහළුවන්ද නිද්‍රාවෙන් මුදන්නට සමත් වෙයි.
"උඹලා හොදට නිදි. ඇඩ්රස් එකක් දූන්නාට අහගෙනම තමා යන්න වෙන්නේ මේ හරියෙ ජී.පී.එස් එකත් වැඩ කරන්නෙ නෑ බන්... බලමු ගෙයක් දොරක් පේන මානයක් ඒව්නේ...

තණ බිම් හා ගොවිපළවල් පසු කරමින් ඉදිරියට ඇදෙන ඩයන්ගේ දෙඇස් බලාපොරොත්තුවේ වට පිටාවට යොමුවෙන අතර, ඔව් ... ඉතින් ජී.පී.එස් එකත් ඔයාලා වගේ තමා, කියන්නෙ එක තැනක් යන්නේ වෙනින් තැනක නෝක්කාඩු ස්වරූපයෙන් කියනා ඉෂාගේ කතා බහ ගැන සැලකිලිමත් නොවු ඩයන් මිතුරන් ගේ ඇස වෙන මානයක යොදවන්නට බලයි. හරි.. හරි...පැය 1 1/2 ක විතර ඩ්‍රයිව් එකක් නේ තියෙනවා කිව්වෙ බලමු මට හිතෙන්නෙ දැන් අපි හරි තැන තමා ඉන්නෙ කියල.

විකාර කොහේ හොයන්නද බං ගෙයක් දොරක් පෙන්න නැති එකේ මේ බුෂ් එකේ කාගෙන් අහන්නද? ඇරත් මග නතර උනොත් තවත් කට්ටක් ,රිකීගේ කතාවිලාස-යට "ඉෂා"ද එකතු වෙමින් ඩයන් අපහසුතාවයට පත්ක-රන්නට සැරසෙන්නේ නිවැරදි පාරක නො ආ ලෙස හඟවන්නටයි.

"බයවෙන්න දෙයක් නෑ රිකි ඩයන් ඉතිං කැලේ සතානේ මතකනේ තැස්මේනියා ගිය වේලේ .බැලුවොත් කැලෑ පාරක තමා යන්න බලන්නෙ... හැබයි ඉතින් ඉවතිනවා කොහොම හරි හොයා ගන්නේ නැතෑ"යි කියමින් ඈ ඩයන්ගේ උරහිස කොනිත්තයි.

කැලේ සතා... කැලේ සතා නම් තමා. ඒ උනත් මේ මුන්ට වගේ පුල්ලි නෑ ඉෂා. මල්ලිලා මං මොන කට්ට කාල හරි උඹලාව නියමතැනට ගෙනියනවා. උඹලා ආතල් එකේ ඇලට් එකක් ගහගෙන යනුවා .ඇව්ල්ලා ගනින්කො මේ වීල් එක ටිකක්...

**රොමේෂ් උඹ හිතුවද... අපේ උන් වගේ මුනුත් ගොසිපයො කියලා. අපිනෙ බන් අහල පහල උන් ගැන වැඩිපුරම හොයන්නෙ.**

ඉදිරිපස කන්නාඩියෙන් මිතුරන් දෙස බලන ඩයන් සි.ඩි තැටි ධාවන යන්ත්‍රයේ හඬ වැඩි කරයි. "ඕන් ඕක අඩු කරපන් ඩයන් කල්බි වර්ෂන් ඩග් බග් ගාන සින්දු දාල වැඩක් නෑ දාපං නිකං සෞන්දර්යත් එක්ක නැගල යන සිංහල සින්දුවක් ....

වීල් එක ගන්න ..උඹ වීල් එක ගන්න කියනවා. වීල් එක ගත්තොත් ඔතන තව වැටර් බොක්ස් එකක් තීනවානේ කන් කරච්චලේ අහගෙන ඉන්න පුලුවන්ද? උඹම ඔය ටිකත් ගෙනියපන්...

කේසර කියූ කතාවට "ඉෂා මදක් කිපුනු බව හඟවමින් බොමින් සිටි වතුර බෝතලයේ වතුර පිටුපස සිටි වුනට දමා ගසයි. "ඉෂා,,,, පොඩි ලමයෙක් වගේනේ. මොනාද ඔයා කරන්නේ එකෙක් කියන්නේ අපියි මේ නාන්නේ. මේ ඩයනෝ දැන්ම ඉදලා මෙයාට "කොලිටීස්" කියනදේ කියලා දීපන්. නැත්තම් උඹට තමා ලෙඩේ වෙන්නෙ.

රිකීගේ කතාවට එල්ලී යන ඉෂා "වින්ටර් එකේවත් නාන්නැති උන්ට සමර් එකේවත් නාන එක කොච්චර දෙයක් ද? ඒකයි නෑව්වෙ තවත් ඔනනම් දෙන්නම්... ඉෂා වතුර බෝතලය පෙන්වයි.

ඇති ඇති උඹලා රන්ඩු කරගන්න ඉස්සෙල්ලා අපි ආව ගමන බලාපන්. ඉෂා,,,,පොඩ්ඩක් බලන්න ඔයා අර නම්බර් එක වැඩ කරනවද කියල. ඒත් වැඩක් වෙන්නෙ නෑ ගෙදර කවුරුත් නෑනේ . කනස්සලු ස්වාභාවයත් වෙහෙසත් අතර පසුවන ඩයාන් සිතනුයේ දැන් කුමක් කලයුතුද යන්නයි.

තාක්ෂණේ දියුණු කාලෙත් මෙහෙම නම් හොයාගන්න බැරි උනොත් මොකද කරන්නෙ අපි වෙන විකල්පයකට යන්න ඕනේ... ඒයි... ආන් අර ...අර ...අර ෆාම් එකේ ගේට් එක ගාව මල් වැට ලඟ වයසක පොරක් ඉන්නවා නේද? රොමේෂ්ගේ උද්දාම වූ හඬ මිතුරන්ගේ විමසිල්ලයට යොමුවෙයි. දෙයියන්ට ස්තුති වේවා ...... දාල බලාපන් ටෝක් එකක් වයසෙ හැටියට මේපලාතෙ අස්සක් මුල්ලක් නෑර දන්නවා ඇති.
රොමේෂ් උඹ හිතුවද... අපේ උන් වගේ මුනුත් ගොසිපයො කියලා. අපි නෙ බන් අහල පහල උන් ගැන වැඩිපුරම හොයන්නෙ.
රිකිගේ පිළිතුරින් රොමේෂ් වැඩි මනත් නොදෙඩා ලජ්ජාව සඟවා නිහඬ වුයේ එය ඔහුටද පැහැදිලි වු දෙයක් ලෙසිනි.
දුරක් ගෙවා ආ මග මේ වතුයාය ඉදිරිපස ඩයන් වාහනය නතර කරන්නේ සතුටුදායක පිලිතුරක් මහල්ලා ගෙන් ලැබේයැයි ප්‍රාර්ථනා කරමිනි. දැඩි වු වෙහෙසට මද විරාමයක් ද තොරතුරක් ලබාගැනිමට පුද්ගලයකුද මුණගැසිම මිතුරන්ගේ සතුටට තවත් කරුණකි.
ෆාම් එකේ ගේට්ටුව අසල ඉන්නා වයෝවෘද්ධ ඔස්ට්‍රේලියානු ජාතිකයා ඔහුගේ වැඩ කටයුතු වල නියැලෙමින් සිටී. පෙනුමෙන් මදක් විශාල වු කතුරකින් වැට කපා මනාව සකස් කරන ආකාරය පෙනේ.කිලිට්වී ගිය ඩෙනිම් කලිසමක් හැඳ එයට රතුපාට කොටු වැටුනු ෆ්ලැනල් කමිසයකින් සැරසුනු ඔහු අසල නතර වූ කාරය ගැන විපරමින් බලයි. ආගන්තුකයිනගේ පැමිණීම ඔහුගේ සතුටට කරුණක් නොවන බැව් පෙනේ. බොර පැහැගැන්වී ගිය දෙනෙත් විශාල වන අයුරුත් නළලේ රැඳුනු රැලිත් මහල්ලාගේ ප්‍රිය මනාප නොවූ බවත් මුහුණෙන් පෙන්නුම් කරයි.

"මහත්තයට කියන්න පුලුවන්ද ලොට් නම්බර් 286 කොහේද කියලා...කිව්ව විදිහටනම් මේ ලඟම තමා ඇත්තේ. ඩයන් අසනා දේ ගැන විමසිල්ලෙන් අසනා වු මහල්ලා ගේ මුහුණ නවතා ඇති වාහනයේ ඇතුලතට එබේ. ආ.. කට්ටිය ඔක්කොම ලොකු උදවිය. පොඩි අය නෑනේ. ඇරත් පොඩි අයත් අරගෙන ගිහින් විනෝද වෙන්න පුළුවනෑ.

"හ් ම් ... ලොට් නම්බර් 286 නේද? ආන් අතන හැරිල යන වැලිපාර. මේ..... මහත්තයලා කොහේ ඉඳලද මේ එන්නේ "යි ප්‍රශ්නාර්ථය ඩයන් වෙත යොමු කරයි. ආ..... මේ..මේ..අපි සිඩ්නි වල ඉඳලා එන්නෙ.ජෙෆ් ගේ ගෙදර තමා හොයන්නේ...

ජෙෆ් ගෙ ගෙදර..හහ් හහ් හා..මහල්ලා දත්විලිස්සා සිනාසේ.ඒ සිනාවේ සැඟවී ගිය ගුප්ත බව මිතුරනට තේරුම් ගැනීමට අපහසුය. ලහි ලහියේ වාහනයට ගොඩ වූ සියල්ලෝම තම ගමනේ ඉසව්ව කරායන්නට වුණි. ඩයනෝ ...අර අංකලයා ක්රැක් කේස් එකක්ද කොහෙදෝ බන්...බලහන් පොඩි උන් ඉන්නවාද අහන-වා..හිනාවෙනවා..මට සැකයි ඒකා හරි පාරද කිව්වේ කියලා...කේසර ගේ ඒ කතාවේ සත්‍යතාවක් ඇතිය යන බිය මොහොතකින් මිතුරනට වැටහිණි.

**මතු සම්බන්ධයි**